7.2.4 පාඩම ඇසුරින් කාලච්ඡේද 02 - දඹුලුගලේ රූ වරුණා

නිපුණතා මට්ටම් -

- ❖ මහනුවර යුගයේ කළා නිර්මාණ ගවේෂණය කරයි.
- ❖ මහනුවර යුගයේ චිත්‍ර වල ගතික ලක්ෂණ අධ්‍යයනය කරයි.
- ❖ ලෙන් පහක් ඇති බවත් එහි ඇති සිතුවම් මොනවාද යන්නත් විස්තර කරයි.

ඉගෙනුම් අත්වැල -

- ❖ දඹුල්ල ලෙන මහනුවර යුගයට අයත් බව
- ❖ චිත්‍ර වර්ගීකරණයේදී ඓතිහාසික සිද්ධි/ බුද්ධ චරිතයේ විවිධ අවස්ථා සමාජමය සිද්ධි මෙන්ම චිත්‍ර නිර්මාණකරණයේද යෙදී ඇති බව

දඹුල්ල ලෙනේ ඇති සිතුවම් මහනුවර යුගයේ දියුණු කළා ලක්ෂණ පැහැදිලිව විස්තර කරයි.

ඓතිහාසික සිද්ධි ලෙස,

- ❖ විජයාවතරණය
- ❖ දුටුගැමුණු එළාර යුද්ධය
- ❖ ශ්‍රී මහා බෝධිය වැඩමවීම

බුද්ධ චරිතයේ අවස්ථා ලෙස,

- ❖ සූවිසි විවරණය
- ❖ මාර පරාජය

දඹුල්ල ලෙන් විහාරයේ දැකිය හැකි සිතුවම් වල පොදු ලක්ෂණ ලෙස,

- ❖ ගුරු මිශ්‍ර රතු වර්ණයෙන් පසුතලය දක්වා තිබීම.
- ❖ මානව රූප, විවිධ ශාක ශෛලිගතව දක්වා තිබීම.
- ❖ සත්ව රූප, මල් මෝස්තර වැනි දෑ ස්වභාවික පරිසරයක ශෛලිගතව ඇඳ තිබීම.
- ❖ බුද්ධ රූප විශාල ප්‍රමාණයක් ඇඳ රශ්මි මාලාව යොදා තිබීම.
- ❖ සියළුම සිතුවම් වටා කලු පැහැති බාහිර රේඛාවක් යොදා මතුකර දැක්වීම.
- ❖ කහ, ගුරු මදිටිය, රතු, දුඹුරු, කළු, සුදු බහුලව භාවිතා කොට තිබීම.

ඇගයීම -

1) දඹුල්ල ලෙන් විහාරයේ බිතු සිතුවම් අයත් වන්නේ කුමන යුගයටදැයි ලියා දක්වන්න.
2) එම බිතු සිතුවම් ඇඳීමේදී ශිල්පියා යොදා ගෙන ඇති තේමාවන් ලියා දක්වන්න.
3) ඇඳීමේදී භාවිතා කර ඇති ශිල්පක්‍රමය ලියා දක්වන්න.
4) එම සිතුවම් වල දක්නට ඇති කලාත්මක ලක්ෂණ විස්තර කරන්න.
5) චිත්‍ර ඇඳීම සඳහා වර්ණ කෙසේ භාවිතා කර ඇත්දැයි විස්තර කරන්න.